# දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

## තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පෙර පාසල් ගුරු තනතුරට අදාල බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත් තුල ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු සංඛ්‍යාව - 01

02. වැටුප් පරිමාණය රා.ප.ච. 3/2016 අනුව **MN-1** වැටුප් බණ්ඩයේ - රු. 27,140-300x10-350x11-495x10-10x660-රු. 45,540 වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්‍ෂමතා කඩඉම් වැටුප් පියවර ඇත.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :* -

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

04. *වෘත්තීය සුදුසුකම් :* -

පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

05. *කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

06. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
- අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. බඳවා ගැනීමේ ක්‍රමය :- ලිඛිත පරීක්ෂණයක් මගින්

| *විෂය නිර්දේශය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාවය හා බුද්ධි පරීක්ෂණය (තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම) | 100 | 40% |
| සාමාන්‍ය දැනීම (මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සිදු කිරීම) | 100 | 40% |

*සේවයේ නියුක්ත කිරවීමේ කොන්දේසි :-*

I මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දායක විය යුතුය.

III පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය.

IV මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ කොන්දේසිවලට ද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට යටත් වේ.

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් විසින් පහත සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකසාගත් අයදුම්පතක් පහත සඳහන් ලිපි ලේඛනවල පිටපත් සමග 2017.12.22 වැනි දිනට පෙර ලේකම්, දෙහිවල-ගොඩ ප්‍රාදේශීය සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහල "පෙර පාසල් ගුරු තනතුරු පුරප්පාඩුව සඳහා අයදුම් කිරීම" ලෙස සටහන් කල යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම් පත
- අධ්‍යාපන සහතික
- පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02 ක්
  (එක් චරිත සහතිකයක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගත යුතුය.)
- වෘත්තීය පලපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

09. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

පී. ජී. පී. රුද්‍රිගෝ,
ලේකම්,
දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේදී.